සියලු ම හිමිකම් ඇවිරිණි.

# ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

## AA1 විභාගය - 2019 ජනවාරි

## (AA15) ව්‍යාපාර මෙහෙයුම් සහ කළමනාකරණය

(Business Operations and Management)

2019-02-03
පස්වරු
[1.45 – 5.00]

පිටු ගණන : 06
ප්‍රශ්න ගණන: 06

- **අයදුම්කරුවන්ට උපදෙස්** (අවධානයෙන් කියවිය යුතුය):

(1) ***දී ඇති කාලය :*** *කියවීම සඳහා - විනාඩි 15 යි.*
*උත්තර ලිවීම සඳහා - පැය 03 යි.*

(2) ***සියලුම ප්‍රශ්නවලට උත්තර සැපයිය යුතු වේ.***

(3) *ඉල්ලුම් කරන ලද **මාධ්‍යයෙන්, එක් භාෂාවකින් පමණක්,** ඔබ වෙත සපයන ලද **පොත්වල උත්තර** ලියන්න.*

(4) *උපකල්පන කිසිවක් ඇතොත්, ඒවා පැහැදිලිව දක්වන්න.*

(5) *අර්ථකථන සහිත **කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව** අමුණා ඇත. වාස්තවික පරීක්ෂණ ප්‍රශ්න හැර අන් සෑම ප්‍රශ්නයක්ම කළ යුතු ක්‍රියාවකින් යුක්ත වේ. කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුවේ එම ක්‍රියාව සඳහා දී ඇති අර්ථකථනය පදනම් කරගෙන අයදුම්කරුවන් විසින් ප්‍රශ්නය සඳහා අවශ්‍ය උත්තර සැපයිය යුතුය.*

(6) *ලකුණු 100 යි.*

---

## A කොටස

### වාස්තවික පරීක්ෂණ ප්‍රශ්න (OTQs)

අනිවාර්ය ප්‍රශ්න විස්ස (20) කි.

(මුළු ලකුණු 40)

### 01 වන ප්‍රශ්නය

*අංක 1.1 සිට 1.15 දක්වා ඇති ප්‍රශ්න සඳහා වඩාත්ම නිවැරදි උත්තරය තෝරන්න. තෝරාගත් උත්තරයට අදාල අංකය ප්‍රශ්න අංකය සමග ඔබේ උත්තර පොතේ ලියන්න.*

**1.1** පහත සඳහන් ඒවා අතුරෙන්, ව්‍යාපාර සංවිධානයක පද්ධතියක ඇති යෙදවුම්වලින් (input) සමන්විත වන කාණ්ඩය තෝරන්න:

(1) සැලසුම්කරණය, සංවිධානකරණය සහ පාලනය.

(2) යන්ත්‍රෝපකරණ, ද්‍රව්‍ය සහ ප්‍රාග්ධනය.

(3) කාර්යක්ෂමතාව, සඵලදායකත්වය සහ ඵලදායිතාව.

(4) භාණ්ඩ සහ සේවා.

**1.2** පහත සඳහන් ඒවා අතුරෙන්, ව්‍යාපාර සංවිධාන, පෞද්ගලික සහ රාජ්‍ය සංවිධාන වශයෙන් වර්ගීකරණය කිරීමට පදනම වන්නේ කුමක් ද?

(1) හිමිකාරීත්වය (Ownership). (2) නිෂ්පාදනයේ ස්වභාවය (Nature of Production).

(3) ප්‍රමාණය (Size). (4) අරමුණ (Objective).

**1.3** පහත සඳහන් ඒවා අතුරෙන්, සංවිධානයක බාහිර ඇල්මැති පාර්ශවයක් (external stakeholder) වන්නේ කවුරුන්ද?

(1) සේවකයින්. (2) කළමනාකරුවන්. (3) සැපයුම්කරුවන්. (4) අධ්‍යක්ෂවරුන්.

1.4 රක්ෂණයේ හානිපූර්ණය පිළිබඳ මූලධර්මය (indemnity principle) අදාල **නොවන** රක්ෂණ ගිවිසුම වන්නේ:

(1) ජීවිත රක්ෂණය. (2) මෝටර් රථ රක්ෂණය. (3) මුහුදු රක්ෂණය. (4) ගිනි රක්ෂණය.

1.5 සැපයුම් දාමයක් (supply chain) ආරම්භ වන්නේ:

(1) රජයෙනි. (2) අවසාන පාරිභෝගිකයන්ගෙනි.

(3) සැපයුම්කරුවන්ගෙනි. (4) බෙදාහරින්නන්ගෙනි.

1.6 පහත සඳහන් ඒවා අතුරෙන්, සන්නිවේදන ක්‍රියාවලියේ මූලිකාංගයක් වන්නේ:

(1) යවන්නා. (2) ප්‍රතිපෝෂණය.

(3) පණිවුඩය. (4) ඉහත සඳහන් සියල්ලම.

1.7 පහත සඳහන් ඒවා අතුරෙන්, ව්‍යාපාර සංවිධානයක ලක්ෂණයක් **නොවන්නේ** කුමක් ද?

(1) එහි විධිමත් ව්‍යුහයක් සහ පද්ධති තිබේ.

(2) එහි පොදු අරමුණක් ළඟාකර ගැනීම සඳහා එක්ව කටයුතු කරන පුද්ගල කණ්ඩායමක් සිටී.

(3) එහි සංවිධානමය වටිනාකම්වලින් අනුගත සංස්කෘතියක් තිබේ.

(4) එය භාණ්ඩ පමණක් නිෂ්පාදනය කරයි.

1.8 පහත සඳහන් ඒවා අතුරෙන්, 1890 හවුල් ව්‍යාපාර ආඥා පනතේ විධිවිධාන සම්බන්ධයෙන් නිවැරදි **නොවන්නේ** කුමක් ද?

(1) හවුල්කරුවෝ දායක වූ ප්‍රාග්ධනය මත පොලියක් ලැබීමට හිමිකම් ලබති.

(2) හවුල්කරුවන්ට වැටුප් ගෙවනු නොලැබේ.

(3) ව්‍යාපාරික ක්‍රියාකාරකම්වලට සම්බන්ධවීමට සියලුම හවුල්කරුවන්ට අයිතිය තිබේ.

(4) ලාභා'ලාභ හවුල්කරුවන් අතර සමසේ බෙදා ගනියි.

1.9 පහත සඳහන් ඒවා අතුරෙන්, අලුතින් කර්මාන්තයට පිවිසෙන්නන්ට බාධකයක් (a barrier to new entrants) **නොවන්නේ** කුමක් ද?

(1) පරිමාණානුකූල පිරිමැසුම් (Economies of scale).

(2) නිෂ්පාදිත විවිධත්වය (Product differentiation).

(3) ආයතනයේ දැක්ම සහ මෙහෙවර (Vision and Mission of the organization).

(4) ප්‍රාග්ධන අවශ්‍යතාවය (Capital requirement).

1.10 පහත සඳහන් ඒවා අතුරෙන්, තොග පාලන පද්ධතියක් ලෙස සළකනු ලබන්නේ කුමක් ද?

(1) ABC වර්ගීකරණ ක්‍රමය. (2) අඛණ්ඩ තොග ක්‍රමය.

(3) කාලච්ඡේද තොග ක්‍රමය. (4) ඉහත සඳහන් සියල්ලම.

1.11 සංවිධානයක තොරතුරු පද්ධති, විවිධ මට්ටම් මත පදනම් වී ඇත. කාර්යාල ස්වයංක්‍රියකරණ පද්ධති [Office Automation System (OAS)] සාමාන්‍යයෙන් භාවිත කෙරෙන්නේ:

(1) උපාය මාර්ගික මට්ටමේදීය. (2) කළමනාකරණ මට්ටමේදීය.

(3) දැනුම් මට්ටමේදීය. (4) මෙහෙයුම් මට්ටමේදීය.

**1.12** පහත සඳහන් ඒවා අතුරෙන්, බාහිර බඳවා ගැනීමේ (external recruitment) වාසියක් වන්නේ කුමක් ද?

(1) එය අභ්‍යන්තර සේවකයන් සංවර්ධනය කරයි.

(2) එය සංවිධානයට නව අදහස් සහ දැනුම ගෙන එයි.

(3) එය අනුස්ථාපනය (induction) සඳහා ගත කෙරෙන කාලය අඩු කරයි.

(4) එය අභ්‍යන්තර සේවකයන් අභිප්‍රේරණය කරයි.

**1.13** පහත සඳහන් ඒවා අතුරෙන්, ගෝලීයකරණයේ තර්ජනයක් වන්නේ කුමක් ද?

(1) නිදහස් වෙළඳාම. (2) නව වෙළෙඳපොළවල් හඳුනා ගැනීම.

(3) සංස්කෘතිමය වෙනස්කම්. (4) මෙහෙයුම්වල ව්‍යාප්තිය.

**1.14** පහත සඳහන් ඒවා අතුරෙන්, සන්නම්කරණයේ (branding) අවාසියක් වන්නේ කුමක් ද?

(1) එය මිලදී ගැනීමේදී පාරිභෝගිකයාගේ අවදානම අඩු කරයි.

(2) එය මිලදී ගැනීමේ තීරණ ඉක්මනින් ගැනීමට පාරිභෝගිකයාට උපකාරී වෙයි.

(3) එය පහසුවෙන් නිෂ්පාදිත හඳුනාගැනීමට පාරිභෝගිකයාට උපකාරී වෙයි.

(4) එමගින් අළුත් සන්නාමයක් ගොඩනැගීම සඳහා ඉහළ පිරිවැයක් දැරීමට සිදුවෙයි.

**1.15** කුසලතා කළමනාකරණයේ (talent management) ප්‍රධාන පැතිකඩයන් වන්නේ:

(1) කාර්යඵල ඇගයීම සහ පුහුණුව හා සංවර්ධනයයි. (2) තෝරාගැනීම සහ ප්‍රතිලාභ කළමනාකරණයයි.

(3) අභිප්‍රේරණය සහ නායකත්වයයි. (4) බඳවාගැනීම සහ අනුස්ථාපනයයි.

*අංක 1.16 සිට 1.20 දක්වා ප්‍රශ්න වල හිස්තැන් පිරවීම සඳහා වරහන් තුළ දී ඇති උත්තර දෙක අතුරින් නිවැරදි උත්තරය තෝරාගන්න. තෝරාගත් උත්තරය, ප්‍රශ්න අංකය සමග, උත්තර පොතේ ලියන්න.*

**1.16** .............. *[ගෝලීයකරණය (Globalization) / පෞද්ගලීකරණය (Privatization)]* යනු තොරතුරු තාක්ෂණයෙන් පන්නරය ලබා ජාත්‍යන්තර වෙළඳාමේ සහ ආයෝජනයේ තියැළි විවිධ ජාතීන් අතර පුද්ගලයන්, සමාගම් සහ රජයන් සමඟ අනුකලනය වන සහ අන්තර් ක්‍රියාකාරී වන ක්‍රියාවලියකි.

**1.17** .............. *[රක්ෂණය (Insurance) / වෙළඳාම (Trading)]* යනු ව්‍යාපාර සංවිධානයක උපකාරක සේවාවකි.

**1.18** .............. *[විකුණුම් සංකල්පයේ (selling concept) / ගනුදෙනුකරු සංකල්පයේ (customer concept)]* අවසාන අරමුණ වන්නේ ඉහළ විකුණුම් තුලින් ඉහළ ලාභ ලැබීමයි.

**1.19** .............. *[අලෙවිකරණය හා විකුණුම් (Marketing and sales) / තාක්ෂණික සංවර්ධනය (Technology development)]* යනු පෝටර්ගේ වටිනාකම් දාමයේ (Porter's Value Chain) මූලික ක්‍රියාකාරකමකි.

**1.20** .............. *[පොදු පිළිගැනීම (General acceptance) / පිටපත්ගත හැකි වීම (Ability to duplicate)]*, හොඳ මුදලක ලක්ෂණයකි.

(එකකට ලකුණු 02 බැගින්, මුළු ලකුණු 40)

*A කොටසෙහි අවසානය*

## B කොටස

අනිවාර්ය ප්‍රශ්න හතර (04) කි.

(මුළු ලකුණු 40)

### 02 වන ප්‍රශ්නය

"කේවලස්වාමි ව්‍යාපාර, හවුල් ව්‍යාපාර, ව්‍යවස්ථාපිත සංවිධාන සහ රාජ්‍ය අංශයේ ව්‍යාපාර සංවිධාන ඇතුළුව සියලුම ව්‍යාපාර සංවිධාන, සංවිධානයේ කාර්යසාධනය කෙරෙහි ප්‍රහල බලපෑමක් ඇතිකළ හැකි සාර්ව පරිසරයක මෙහෙයුම් කටයුතු සිදුකරනු ලබයි. ව්‍යාපාර සංවිධානය කෙරෙහි සාර්ව පාරිසරික විචල්‍යයන්ගේ බලපෑම හඳුනාගැනීම පිණිස PEST විශ්ලේෂණය භාවිත කරනු ලැබේ."

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) එක් එක් විචල්‍ය සඳහා උදාහරණ දෙකක්(02) සමඟ PEST විශ්ලේෂණය **පැහැදිලි කරන්න**. (ලකුණු 06)

(b) සීමාසහිත පෞද්ගලික සමාගමක වාසි දෙකක්(02) සහ අවාසි දෙකක්(02) **සඳහන් කරන්න**. (ලකුණු 04)

(මුළු ලකුණු 10)

### 03 වන ප්‍රශ්නය

සංවිධානයක උපායමාර්ගික අරමුණු ඉටුකරගැනීම සඳහා සංවිධානයට අවශ්‍ය කෙරෙන මානව සම්පත්, මිනිස් බල (මානව සම්පත්) සැලසුම්කරණය මඟින් තීරණය කරනු ලබයි. තවද, සංවිධානයක ගුණාත්මක (තත්ත්ව) කළමනාකරණය ළඟාකර ගැනීමට සහ පවත්වා ගැනීමට සියලුම සේවකයන්ගේ ක්‍රියාකාරී සහභාගීත්වය සහ සහයෝගය අවශ්‍ය වේ.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) (i) මිනිස්බල සැලසුම්කරණයේ අරමුණු තුනක්(03) **සඳහන් කරන්න**. (ලකුණු 03)

(ii) සංවිධානයක මානව සම්පත් අතිරික්තයක් මැඩ පැවැත්වීමට භාවිත කළ හැකි උපායමාර්ග දෙකක්(02) **සඳහන් කරන්න**. (ලකුණු 02)

(b) (i) පූර්ණ තත්ත්ව කළමනාකරණයේ [Total Quality Management (TQM)] මූලධර්ම තුනක්(03) **සඳහන් කරන්න.** (ලකුණු 03)

(ii) සේවා සඳහා ඕනෑම ගුණත්ව මානයන්, දෙකක්(02) **හඳුනා දක්වන්න**. (ලකුණු 02)

(මුළු ලකුණු 10)

### 04 වන ප්‍රශ්නය

අලෙවිකරණය යනු පාරිභෝගිකයන්ගෙන් වටිනාකම් නැවත අයකර ගැනීම පිණිස සමාගම් විසින් පාරිභෝගිකයන් සඳහා වටිනාකම් නිර්මාණය කිරීම සහ ප්‍රහල පාරිභෝගික සම්බන්ධතා ගොඩනගා ගැනීමේ ක්‍රියාවලියයි. වර්තමාන තරඟකාරී ලෝකයේ, නිෂ්පාදිත සන්නම්කරණය කර තිබීම පාරිභෝගිකයින් විසින් අපේක්ෂා කරයි.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) සන්නම්කරණය වැදගත් වන්නේ කුමක් නිසාදැයි යන්නට හේතු තුනක්(03) **පැහැදිලි කරන්න**. (ලකුණු 06)

(b) අලෙවිකරණයේදී භාවිත කෙරෙන පහත දැක්වෙන පද **පැහැදිලි කරන්න**:

(i) වෙළෙඳපොළ ඛණ්ඩනය (Market segmentation).

(ii) ස්ථානගත කිරීම (Positioning). (ලකුණු 04)

(මුළු ලකුණු 10)

### 05 වන ප්‍රශ්නය

මෙහෙයුම් කළමනාකරණය යනු නිෂ්පාදන ක්‍රියාවලින් සැලසුම් කිරීම (designing) හා පාලනය සහ භාණ්ඩ හා සේවා නිෂ්පාදනය පිළිබඳ ව්‍යාපාරික මෙහෙයුම් නැවත සැලසුම් කිරීමට (re-designing) අදාල කළමනාකරණයේ සලකනු ලබන ක්ෂේත්‍රයකි.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) සංවිධානයක් සඳහා මෙහෙයුම් කළමනාකරණය වැදගත් ලෙස සැලකීමට හේතු තුනක්(03) **පැහැදිලි කරන්න**. (ලකුණු 06)

(b) සමාගම් ඒවායේ කාර්යයන් වෙනත් සංවිධාන මඟින් බාහිර මූලාශ්‍රගතකරණය කිරීමට (outsource) ප්‍රධාන හේතු දෙකක්(02) **පැහැදිලි කරන්න**. (ලකුණු 04)

(මුළු ලකුණු 10)

*B කොටසෙහි අවසානය*

## C කොටස

අනිවාර්ය ප්‍රශ්නයකි.

(මුළු ලකුණු 20)

### 06 වන ප්‍රශ්නය

**රූබි,** ලාභ අරමුණු කර නොගත්, පුහුණු සහ සංවර්ධන සංවිධානයක් වන SETA **(සමාජ ව්‍යවසායකත්ව පුහුණු සංගමය) (Social Entrepreneurships Training Association)** හි, ව්‍යාපෘති කළමනාකාරිණිය වේ. පුහුණු සහ සංවර්ධන ව්‍යාපෘති සැලසුම් කිරීම, උපකරණ සම්පාදනය, දත්ත එකතු කිරීම හා විශ්ලේෂණය සහ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම යන ක්‍රියාකාරකම්වල **SETA** නිරතව සිටී. දැනට **රූබි**, ප්‍රධාන පෙළේ බහුජාතික සමාගමක (Multi-National Company) වැදගත් දිගුකාලීන පුහුණු සහ සංවර්ධන ව්‍යාපෘතියක් බාරව සිටී.

SETA හි අධ්‍යක්ෂවරියක ද වන **ශිරෝමි** ඇයගේ ආසන්නතම අධීක්ෂකවරිය වේ. **රූබිගේ** වැඩ, විශේෂයෙන් ඇය විසින් දැනට සිදුකරමින් සිටින ව්‍යාපෘතිය වැනි මහා පරිමාණ වූ ද සංකීර්ණ වූ ද ව්‍යාපෘති කළමනාකරණය කිරීමෙහිලා ඇයගේ හැකියාව පිළිබඳ **ශිරෝමි** විසින් **රූබිව** කිප වතාවකදීම ඇගයීමට ලක්කර තිබුණි.

ව්‍යාපෘතිය ආරම්භවීමෙන් පසුව, ව්‍යාපෘති කළමනාකාරිණිය වශයෙන් ඇයගේ රාජකාරි සහ වගකීම් පිළිබඳව අවස්ථා ගණනාවකදීම **රූබිට, ශිරෝමි** සමග බරපතල මතගැටුම් කිපයක් ඇති විය. වැඩ නිමකිරීම සඳහා දැඩි (tight) කාලසටහන්, දිග්ගැස්සුනු වැඩ කරන පැය ගණන් සහ පුහුණු හා සංවර්ධන කාර්යයන්හි පැවති තාක්ෂණ විශේෂඥයන්ගේ අඩුකම ආදිය මගින් **රූබිව** පීඩාකාරි තත්ත්වයකට පත්කිරීමට මහපාදා ඇති බව පෙනී යයි. ඇතැම් ගැටුම්, බොහෝවිට **රූබි** සහ **ශිරෝමි** අතර වූ "පෞද්ගලික ගැටුම්" (personality conflict) නිසා බවද පෙනී යන්නකි. එකිනෙකා කෙරෙහි ඔවුන්ගේ අමනාපය බොහෝ කාර්යමණ්ඩල රැස්වීම්වලදී මෙන්ම ව්‍යාපෘති ප්‍රගති සමාලෝචන රැස්වීම්වලදී ද නිතර දැකිය හැකි විය.  තවද ඇයගේ වැටුප වැඩිකරන ලෙස **රූබි** කිප වතාවක් ඉල්ලා සිටියද එයද සලකා බලා නොතිබුණි.

එමනිසා, ඇයගේ වැඩකිරීමේ පරිසරය පිළිබඳව **රූබිගේ** නොසතුට (dissatisfaction) ක්‍රමයෙන් වැඩිවෙමින් පැවති අතර, ඇය සේවය සඳහා නොපැමිණීමද වැඩිවිය. අවසාන වශයෙන් **රූබි** ඉල්ලා අස්වීමට තීරණය කළාය. **SETA** හි, පැවති මානව සම්පත් කළමනාකරණ ප්‍රතිපත්ති අනුව, මාසයක කාලය ඉකුත්වූ පසු ඇය විසින් තනතුරෙන් ඉවත්වන බව සඳහන් කොට **රූබි** ඇගේ ඉල්ලා අස්වීමේ ලිපිය බාර දුන්නාය.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) **රූබිගේ** දුක් ගැනිවිලි (grievances) සඳහා හේතු තුනක්(03) **පැහැදිලි කරන්න**. (ලකුණු 06)

(b) **රූබි** වෙනුවට සුදුසු අයදුම්කරුවෙකු තෝරා ගැනීමේදී මානව සම්පත් කළමනාකරු විසින් අනුගමනය කළ යුතු පටිපාටියේ පියවරයන් **හඳුනා දක්වන්න**. (ලකුණු 05)

(c) **රූබිගේ** ඉල්ලා අස්වීමෙන් පසු, අලුතෙන් පත් කරගත් ව්‍යාපෘති කළමනාකරුට **රූබි** විසින් මෙහෙයවන ලද වර්තමාන ව්‍යාපෘතිය, දත්ත කැණීමේ (data mining) ක්‍රමය භාවිත කරමින්, පැහැදිලි කිරීමට **ශිරෝමි** ට අවශ්‍ය විය.

දත්ත පදනම්වලට අදාලව "දත්ත කැණීම්" (data mining) යන්නෙන් අදහස් කරන්නේ කුමක්දැයි **පැහැදිලි කරන්න**. (ලකුණු 03)

(d) ලාභ අරමුණු කර නොගත් සංවිධානයක් (not-for-profit organization) ලෙස **SETA** හි අලෙවිකරණ මිශ්‍රයේ (4P's) ඇතුලත් විචල්‍ය තුනක්(03) **පැහැදිලි කරන්න**. (ලකුණු 06)

(මුළු ලකුණු 20)

*C කොටසෙහි අවසානය*

# <u>කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව</u>

| දැනුම් ක්‍රියාවලිය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචන |
|---|---|---|
| 01 මට්ටම<br>**අවබෝධය**<br><br>වැදගත් තොරතුරු ආවර්ජනය සහ පැහැදිලි කිරීම. | **නිර්වචනය කරන්න** | ස්වභාවය, විෂය පථය හෝ තේරුම නිශ්චිතව ප්‍රකාශ කිරීම. |
| | **අඳින්න** | හැඩයක් හෝ රූපසටහනක් ගෙන හැර දැක්වීම. |
| | **හඳුනා දක්වන්න** | යමක් මනා සැලකිලිමත් වීමකින් අනතුරුව හඳුනා ගැනීම හෝ තහවුරු කිරීම හෝ තෝරා ගැනීම. |
| | **ලැයිස්තුගත කරන්න** | විස්තර කිරීමකින් තොරව අදාල කරුණු එකින් එක වචනයෙන් ලියා දැක්වීම. |
| | **සම්බන්ධ කරන්න** | තාර්කික හෝ හේතු කාරක සම්බන්ධතාවය පෙන්නුම් කිරීම හෝ තහවුරු කිරීම. |
| | **සඳහන් කරන්න** | යමක් ස්ථිර ලෙස පැහැදිලිව ප්‍රකාශ කිරීම. |
| | **ගණනය කරන්න** | ගණිතමය ගණනය කිරීම. |
| | **විමසන්න** | අවසන් නිගමනයකට පිවිසීම සඳහා විවිධ පැතිකඩ තර්කානුකූලව සවිස්තරව පරීක්ෂා කිරීම. |
| | **පැහැදිලි කරන්න** | අදාල කරුණු සවිස්තරාත්මකව දැක්වීම. |
| | **අර්ථකතනය කරන්න** | අවබෝධයට පහසු සුපුරුදු පද මගින් අර්ථය ඉදිරිපත් කිරීම. |
| | **හඳුනාගන්න** | සෙවීමෙන් හෝ ප්‍රයත්න දැරීමෙන් නිගමනයකට එළඹීම. |
| | **සටහන් කරන්න** | අදාල කරුණු විස්තරාත්මකව සටහන් කිරීම. |
| | **සාරාංශගත කරන්න** | කරුණු වශයෙන් හෝ සංඛ්‍යා වශයෙන් ප්‍රධාන කරුණු කෙටියෙන් දැක්වීම. |

| දැනුම් ක්‍රියාවලිය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචන |
|---|---|---|
| 02 මට්ටම<br>**භාවිතය**<br><br>ඉගෙනගත් පසුබිම නොවන පසුබිමක දැනුම භාවිත කිරීම / සංවෘත ගැටළු විසඳීම. | **භාවිත කරන්න** | ප්‍රයෝගිකව භාවිතයේ යොදන්න. |
| | **තක්සේරු කරන්න** | වටිනාකම, ස්වභාවය, හැකියාව හෝ ගුණාත්මක බව තීරණය කරන්න. |
| | **ප්‍රදර්ශනය කරන්න** | සුවිශේෂී ලෙස උදාහරණ සමග ඔප්පු කරන්න. |
| | **ප්‍රස්තාර දක්වන්න** | ප්‍රස්තාර මගින් නියෝජනය කරන්න. |
| | **පිළියෙල කරන්න** | දී ඇති විස්තර සැලැස්මකට ගොනු කිරීම. |
| | **ප්‍රමුඛතා දක්වන්න** | වැදගත්කම, අනුපිළිවෙල අනුව දක්වන්න. |
| | **සසඳන්න** | තවත් දෙයක් සමග සංගත වේදැයි බැලීම. |
| | **විසඳන්න** | ගණනය කිරීම හා / හෝ පැහැදිලි කිරීම් හරහා විසඳුම් සෙවීම. |

| දැනුම් ක්‍රියාවලිය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචන |
|---|---|---|
| 03 මට්ටම<br>**විශ්ලේෂණය**<br><br>අදහස් අතර සම්බන්ධතා ගොඩනගා සමාන අසමානතා බැලීම / විවෘත ගැටළු විසඳීම. | **විශ්ලේෂණය කරන්න** | විසඳුම් හෝ ප්‍රතිඵලය තීරණය කිරීම පිණිස විස්තරාත්මකව පරීක්ෂා කරන්න. |
| | **සමානකම් බලන්න** | සමානකම් සොයා ගැනීම පිණිස පරීක්ෂා කිරීම. |
| | **අසමානතා බලන්න** | අසමානතා හෝ වෙනස්කම් සෙවීම පිණිස පරීක්ෂා කිරීම. |
| | **වෙනස්කොට දක්වන්න** | යමක් තවෙකෙකින් වෙනස්කොට දක්වන දෑ හඳුනා ගැනීම. |
| | **සැකිල්ලක් සේ දක්වන්න** | සුවිශේෂී ලක්ෂණ සාරාංශ කොට දැක්වීම. |